| | | |
|---|---|---|
| | මගේ අංකය | ;- MPS/01/07 |
| | எனது இல | ;- |
| | My No | :- |
| | ඔබේ අංකය | :- |
| | உனது இல | :- |
| | Your No | :- |
| **මාලිම්බඩ ප්‍රාදේශීය සභාව** - මාලිම්බඩ | දිනය | :- 2023.01.03 |
| **மாலிம்பட பிரதேச சபை - மாலிம்பட** | திகதி | :- |
| MALIMBADA PRADESHIYA SABHA - MALIMBADA | Date | :- |

දු.ක./ෆැක්ස් தொலைபேசி/ தொலைநகல் Telephone / Fax:- 041-2240208

# මාලිම්බඩ ප්‍රාදේශීය සභාව
# 2023.01.04 වන දින මාසික සභා රැස්වීම් වාර්තාව

සහභාගීත්වය :-

- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
- ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
- ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
- ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
- ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
- ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
- ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
- ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
- ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා
- ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 2023 ජනවාරි මස මාසික සභා රැස්වීම 2022.01.04 දින ගරු සභාපති සෝමසිරි වීරමන් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පෙ.ව. 10.30 ට මාලිම්බඩ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ආරම්භ කරන ලදී.

***01. පසුගිය සභා වාර්තා සභා සම්මත කිරීම.***

2022.12.09 වන දින පැවති විශේෂ සභාවේ වාර්තාව සභා සම්මත කිරීම.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ගරු මන්ත්‍රී පිට්දුව ගමගේ විමලවංශ මහතා
සභාපතිතුමා මම 2022.12.09 විශේෂ සභාව නීති විරෝධි බවට විරෝධය පල කළා ඒක වාර්තාවට ඇතුළත් කරන්න.

ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
මන්ත්‍රීතුමා ඔබතුමාගේ ඉල්ලීම මම පිළිගත්තා.නොසලකා හැරියේ නෑ.ඔබතුමාගේ පලවෙනි කාරණාව මම ඒ ආකාරයෙන්ම පිළිගත්තා.ඒ වගේම ඔබතුමාගේ ඉල්ලීම ගැන මම පළාත් පාලන කොමසාරිස්තුමාගෙ උපදෙස් පතලා ලියුමට උත්තරයක් එවන්න කියලා ලියුමක් යැව්වා.පළාත් පාලන කොමසාරිස්තුමා ඒක නීති විරෝධි කියලා කිව්වොත් අපිට ඒක අයින් කරන්න වෙනවා.ඒ නිසා මට පෙනෙන විදියට මේක නීත්‍යානුකූලයි.ඒකයි විශේෂ සභා රැස්වීම දැම්මේ.කිසි ගැටලුවක් නෑ.ඔබතුමාගේ විරෝධය අපි සටහන් කරගන්නම්.ඒක පැත්තකට දාලා නෑ.අවශ්‍ය නම් ඒ යවපු ලියුමත් කියවන්නම්.

ඒ අනුව 2022.12.09 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

2022.12.13 වන දින පැවති මහා සභාවේ වාර්තාව සභා සම්මත කිරීම

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

### *02. සභාපතිවරයා විසින් කරන විශේෂ නිවේදන*

අද දින මේ රැස්වීම අන්තිම රැස්වීම වෙන්නත් පුළුවන්.හෙටින් අපි අහෝසි වෙන්නත් පුළුවන්.මාස 03ක් දක්වා වැඩ කිරීම මත නාම යෝජනා කැඳවන්නත් පුළුවන්.අවුරුද්දක් දික් වෙන්නත් පුළුවන්.මේ කාරණා කිහිපයකින් එකක් තමා වෙන්නේ.මම සභාව ක්‍රියාත්මක කිරීමේදී නීත්‍යානුකූලව සිදු කිරීමට කටයුතු කරලා තියනවා.වැරදි නිවැරදි කරගෙන සභාවක් විදියට කටයුතු කරමු කියලා තමයි කියන්න තියෙන්නේ.

### *03. සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.*

- හොරගොඩ මුස්ලිම් ගම්මාන ප්‍රදේශවාසීන් විසින් එවන ලද "හොරගොඩ මුස්ලිම් ගම්මානයේ පිහිටි හොරගොඩ මීරා ජුම්මා දේවස්ථානය යාබදව පිහිටි සුසාන භූමියට අයත් ඉඩම් කොටස දේවස්ථානයට පවරා ගැනීම" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- හින්නක්මුල්ල කැරන්තොල්ල ගම්වාසීන් විසින් එවන ලද " කැරන්තොල්ල හින්නක්මුල්ල සිට වල්ගමුවත්ත දක්වා ඇති පාර සහ ඉඩම පිළිබඳව" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් එවන ලද "රාජකාරි කටයුතු සිදු කිරීමේදී අල්ලස් ලෙස මුදල් ලබා ගැනීම සම්බන්ධව" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- හොරගොඩ,ආදාදොළ,බ්ලූමින් කිඩ්ස් පෙර පාසල ප්‍රධානාචාර්යතුමිය විසින් එවා තිබූ "ප්‍රාදේශීය සභාව සතු දේපල අනිසි ලෙස පරිහරණය කිරිම හා බැදී ලිපිය සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- මැදගෙදර,අකුරුගොඩ,තෙලිජ්ජවිල යූ.ඒ දයාපාල නැමති අය විසින් එවා තිබූ "කඩ බද්ද නිදහස් කිරීම" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.

- සංවර්ධන නිලධාරි එච්.බී.ගනේෂා ගීතානි මිය විසින් ඉදිරිපත් කර තිබූ" කොම්පෝස්ට් ව්‍යාපෘතිය මාලිම්බඩ ප්‍රාදේශීය සභාව 2022 දෙසැම්බර් මස ආදායම් වියදම් වාර්තාව" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- ඊ.එල් මධුර දීපික විසින් එවා තිබූ "PF-7353 අංක දරණ කැබ් රථය සේවා කිරීම සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- හොරගොඩ,බෝගොඩවත්ත සභික ජී.පී.උදයසාන්ත මහතා විසින් එවා තිබූ "දේව තොවිලය සඳහා අනුග්‍රහය ලබා ගැනීම සම්බන්ධවයි" යන හිසින් යුත් ලිපිය සභාගත කරන ලදී.
- ඩබ්.කේ.ඩසිංක උදයංග මහතා විසින් ඉදිරිපත් කරන ලද"ගැඩවිල් දියර පොහොර හා ඝන පොහොර ව්‍යාපෘතිය දෙසැම්බර් මස ආදායම්/වියදම් (පුනරාවර්ථන හා ප්‍රාග්ධන) වාර්තාව "යන හිසින් යුත් ලිපිය සභා ගත කරන ලදී.

***04.යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත.***

***05. යථා පරිදි කල්දී ඇති යෝජනා***

<u>**යෝජනා අංක 5:1**</u>

2022/12/09 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු උප සභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>**තීරණ අංක 5:1**</u>

2022/12/09 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

<u>**යෝජනා අංක 5:2**</u>

2022.12.13 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

<u>**තීරණ අංක 5:2**</u>

2022.12.13 දින පැවති මුදල් කමිටු වාර්තාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

<u>**යෝජනා අංක 5:3**</u>

2023 වර්ෂය සඳහා සැලසුම් කමිටුවේ සාමාජිකයින් ලෙස පහත නම් සඳහන් අය සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

<u>නාගරික වන ප්‍රදේශ සඳහා</u>

i. සභාපති - සෝමසිරි වීරමන් මයා
ii. ලේකම් - එච්.එච්. අසංකා කුමාරි මිය
iii. සැලසුම් නිලධාරි - ඕ.ජී නිල්මිණි මිය
iv. තාක්ෂණ නිලධාරි - අංජලිකා උදයන්ති මිය
v. තාක්ෂණ නිලධාරි - බී.ඒ.කේ ශාන්ත මයා
vi. මහජන සෞඛ්‍ය පරික්ෂක - ඩී.ආර්.ඒ නිහාල් මයා
vii. සංවර්ධන නිලධාරි - කේ.එස්.ඒ ශානිකා මිය
viii. තාක්ෂණ නිලධාරි - එම්.ඒ.කසුන් සමීර මයා

<u>නාගරික නොවන ප්‍රදේශ සඳහා</u>

i. සභාපති - සෝමසිරි වීරමන් මයා
ii. උප සභාපති - පී.ජී පාලිත කුමාර මයා
iii. ප්‍රා.ස මන්ත්‍රී - බන්දුල දික්මාදුගොඩ මයා
iv. ප්‍රා.ස මන්ත්‍රී - පී.ජී විමලවංශ මයා
v. ලේකම් - එච්.එච්. අසංකා කුමාරි මිය
vi. තාක්ෂණ නිලධාරි - බී.ඒ.කේ ශාන්ත මයා
vii. මහජන සෞඛ්‍ය පරික්ෂක - ඩී.ආර්.ඒ නිහාල් මයා
viii. සංවර්ධන නිලධාරි - කේ.එස්.ඒ ශානිකා මිය
ix. තාක්ෂණ නිලධාරි - එම්.ඒ.කසුන් සමීර මයා

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උප සභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>තීරණ අංක 5:3</u>
2023 වර්ෂය සඳහා සැලසුම් කමිටුවේ සාමාජිකයින් ලෙස පහත නම් සඳහන් අය සුදුසු බවට තීරණය විය.

<u>නාගරික වන ප්‍රදේශ සඳහා</u>

ix. සභාපති - සෝමසිරි වීරමන් මයා
x. ලේකම් - එච්.එච්. අසංකා කුමාරි මිය
xi. සැලසුම් නිලධාරි - ඕ.ජී නිල්මිණි මිය
xii. තාක්ෂණ නිලධාරි - අංජලිකා උදයන්ති මිය

xiii. තාක්ෂණ නිලධාරි - බී.ඒ.කේ ශාන්ත මයා

xiv. මහජන සෞඛ්‍ය පරික්ෂක - ඩී.ආර්.ඒ නිහාල් මයා

xv. සංවර්ධන නිලධාරි - කේ.එස්.ඒ ශානිකා මිය

xvi. තාක්ෂණ නිලධාරි - එම්.ඒ.කසුන් සමීර මයා

<u>නාගරික නොවන ප්‍රදේශ සඳහා</u>

x. සභාපති - සෝමසිරි වීරමන් මයා

xi. උප සභාපති - පී.ජී පාලිත කුමාර මයා

xii. ප්‍රා.ස මන්ත්‍රී - බන්දුල දික්මාදුගොඩ මයා

xiii. ප්‍රා.ස මන්ත්‍රී - පී.ජී විමලවංශ මයා

xiv. ලේකම් - එච්.එච්. අසංකා කුමාරි මිය

xv. තාක්ෂණ නිලධාරි - බී.ඒ.කේ ශාන්ත මයා

xvi. මහජන සෞඛ්‍ය පරික්ෂක - ඩී.ආර්.ඒ නිහාල් මයා

xvii. සංවර්ධන නිලධාරි - කේ.එස්.ඒ ශානිකා මිය

xviii. තාක්ෂණ නිලධාරි - එම්.ඒ.කසුන් සමීර මයා

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

<u>යෝජනා අංක 5:4</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව, 2023 වර්ෂය සඳහා මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ බලතල, කාර්යයන් පහසු කර ගැනීම සඳහා පහත එක් එක් විෂය සම්බන්ධයෙන් සභාවේ සභිකයන්ගෙන් සමන්විත කාරක සභා පත් කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

**1.මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටුව -**

ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී පිටිදුව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදයශාන්ත මහතා

ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

**2 නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කමිටුව -**

ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් වන තරංගා මැතිතුමිය, නිරෝෂා පුෂ්පාදරී මැතිතුමිය, දිස්නා ධර්මවර්ධන මැතිතුමිය.

**3 කාර්මික සේවා කමිටුව -**

ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් වන බන්දුල දික්මාදුගොඩ මැතිතුමා, අජිත් නාලක මැතිතුමා, දිස්නා ධර්මවර්ධන මැතිතුමිය.

**4 පරිසර සහ පහසුකම් කමිටුව-**

ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් වන රචිත මොහොට්ටි මැතිතුමා, සාගර එදිරිසූරිය මැතිතුමා, වසන්ත මුණසිංහ මැතිතුමා, ජී.පී උදයශාන්ත මැතිතුමා, සමන් දෙනිපිටිය මැතිතුමා, නිලන්ත ධම්මජිත් මැතිතුමා, හර්ෂණී ගුණසේකර මැතිතුමිය,

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උප සභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:4</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව, 2023 වර්ෂය සඳහා මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ බලතල, කාර්යයන් පහසු කර ගැනීම සඳහා පහත එක් එක් විෂය සම්බන්ධයෙන් සභාවේ සභිකයන්ගෙන් සමන්විත කාරක සභා පත් කිරීම සුදුසු බවට තීරණය විය.

**1.මුදල් හා ප්‍රතිපත්ති සැකසීම පිළිබඳ කමිටුව -**

ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ගරු මන්ත්‍රී පිටිදූව ගමගේ විමලවංශ මහතා
ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
ගරු මන්ත්‍රී ජී.පී. උදයශාන්ත මහතා
ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

**2 නිවාස හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ කමිටුව -**

ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් වන තරංගා මැතිතුමිය, නිරෝෂා පුෂ්පාදරී මැතිතුමිය, දිස්නා ධර්මවර්ධන මැතිතුමිය.

**3 කාර්මික සේවා කමිටුව -**

ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් වන බන්දුල දික්මාදුගොඩ මැතිතුමා, අජිත් නාලක මැතිතුමා, දිස්නා ධර්මවර්ධන මැතිතුමිය.

**4 පරිසර සහ පහසුකම් කමිටුව-**

ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන් වන රචිත මොහොට්ටි මැතිතුමා, සාගර එදිරිසූරිය මැතිතුමා, වසන්ත මුණසිංහ මැතිතුමා, ජී.පී උදයශාන්ත මැතිතුමා, සමන් දෙනිපිටිය මැතිතුමා, නිලන්ත ධම්මජිත් මැතිතුමා, හර්ෂණී ගුණසේකර මැතිතුමිය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:5</u>**

මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ ප්‍රසම්පාදන කමිටුව ලෙස මුදල් කමිටුවම කටයුතු කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:5</u>**

මාලිම්බඩ ප්‍රාදේශිය සභාවේ ප්‍රසම්පාදන කමිටුව ලෙස මුදල් කමිටුවම කටයුතු කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 5:6</u>**

1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 134(1) වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් 2022.06.20 දින යෝජනා අංක 5.8 යටතේ දියුණු කළ ප්‍ර දේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට ගනු ලැබූ තීරණය සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලැබී ඇති බැවින් හා 2022.09.30 දින අංක 2300 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇති බැවින් එකී ප්‍රදේශයේ පිහිටියා වූ සියලු නිශ්චල දේපල සහ ඒවායේ වාර්ෂික වටිනාකම් තක්සේරු කිරීමටත්, එසේ තක්සේරු කරන ලද වාර්ෂික වටිනාකම මත වරිපනම් නියම කිරීමටත් සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 5:6</u>**

1987 අංක 15 දරන ප්‍රදේශීය සභා පනතේ 134(1) වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව මාලිම්බඩ ප්‍රාදේශීය සභාව විසින් 2022.06.20 දින යෝජනා අංක 5.8 යටතේ දියුණු කළ ප්‍ර දේශයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට ගනු ලැබූ තීරණය සඳහා පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අනුමැතිය ලැබී ඇති බැවින් හා 2022.09.30 දින අංක 2300 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇති බැවින් එකී ප්‍රදේශයේ පිහිටියා වූ සියලු නිශ්චල දේපල සහ ඒවායේ වාර්ෂික වටිනාකම් තක්සේරු කිරීමටත්, එසේ තක්සේරු කරන ලද වාර්ෂික වටිනාකම මත වරිපනම් නියම කිරීමටත් සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:7</u>**

ජංගම සේවයේ ඉල්ලීමක් මත ඕගස්පේ පැරණි පුස්තකාල ගොඩනැගිල්ලේ පෙර පාසලක් ආරම්භ කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 5:7</u>**

ජංගම සේවයේ ඉල්ලීමක් මත ඕගස්පේ පැරණි පුස්තකාල ගොඩනැගිල්ලේ පෙර පාසලක් ආරම්භ කිරීමට සුදුසු බවට තීරණය විය.

<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>

ගරු සභාපතිතුමනි,මට දැනගන්න ඕන මේ පෙර පාසල සභා අරමුදලින් පවත්වන එකක්ද ඒ වගේම මේකට බඳවා ගන්නා ගුරුවරු ඩිප්ලෝමා වැනි සුදුසුකම් සහිත ගුරුවරුද කියලා.ඒ වගේම ඒ අයගේ ගෙවීම් කරන්නෙ කොහොමද?කීයක් ගෙවීම් කරනවද?ඒ ප්‍රශ්න ටික තියනවා.පසුගිය දවස් වල චක්‍රලේඛ අනුව එහෙම වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා නම් ළමයෙකුගෙන් 250 වෙන්න අය කරත් ළමයි 10ක් නම් 2500යි,20ක් ඉන්නවා නම් 5000යි,40ක් නම් 10000යි,50ක් නම් 12500යි.රු15000ක වගේ රෙන්ට් එකකටනෙ බලන්නෙ.මං දැනගන්න කැමතියි පෙර පාසල පටන් ගත්තම මුදලක් අය කරන් නැතුව සභාව මගින් පවත්වද්දී ඒ ළමයි බඳවා ගන්නෙ කොහොමද?හදිසියෙන් වෙනිඅකුලින්,සෙන්ට්‍රල් පාර්ක් වලින්,ඕගස්පෙන්,ගල්පමුණෙන්,මාලිම්බඩින්,කිරිමැටිමුල්ලෙන් වගේ ප්‍රදේශ වලින් එන්න පුළුවන් මුදල් අය කරන්නැතුව කරද්දී.එහෙම කෙනෙක් ආවොත් බඳවා ගැනීමේ වැඩපිළිවෙලක් තියනවද?නැත්තම් කොහේහරි පෙර පාසලක ඉන්න ළමයි ටිකක් ගෙනත් දාලා ඒ ළමයිට විතරක් මේ පහසුකම දෙනවද?වැඩපිළිවෙලක් තියනවා නම් ඉදිරිපත් කරන්න කියලා ඉල්ලීමක් කරනවා. එහෙම වුනොත් අපිට එකඟ වෙන්න පුළුවන්.නැත්තම් අපි දන්නැනේ.කවුරුහරි කිව්වොත් අපේ ළමයෙක් ඉන්නවා දාලා දෙන්න කියලා එතනදි ප්‍රශ්න ඇති වෙන්න පුළුවන්.ඒ නිසා වැඩපිළිවෙලක් තියනවද කියලා පැහැදිලි කරන්න.ස්තූතියි.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මයා</u>

ගරු මන්ත්‍රීතුමනි,මේ පෙර පාසල ආරම්භ කරන්නෙ අනිකුත් පෙර පාසල් ආරම්භ කරපු විදියට.සභාවෙන් පඩි ගෙවන පෙර පාසලක් නෙවෙයි.චක්‍රලේඛයක් තියනවා සභාවෙන් අලුතින් පෙර පාසලක් ආරම්භ කරන්න බෑ කියලා.දිවා සුරකුම් මධ්‍යස්ථානයක් නම් පුළුවන්.තියන පෙර පාසලකට මේ ගොඩනැගිල්ල දීලා අපි බද්දක් අයකර ගන්නවා.තක්සේරුවෙන් දෙන බදු කුලිය පෙර පාසලකට ගෙවන්න බෑ.තක්සේරුවට යවනවා බද්දක් අය කරලා දෙන්න කියලා.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 5:8</u>**

බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහා අරමුදලින් කොපි පොත් සහ පාසල් උපකරණ ලබාදීමටත් ඒ සඳහා රු 1000000.00ක පහත වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමටත් ගරු සභාවට යෝජනා කරමි.

| වියදම් දරනු ලබන කාරණය | දළ ඇස්තමේන්තුව රු. |
|---|---|
| 01.බල ප්‍රදෙශයේ කොට්ඨාශ 10 නියෝජනය වන පරිදි පාසල් දරුවන් 1000ක් සඳහා රු.1000ක් වටිනා පාසල් උපකරණ ලබාදීම | 1000*1000 |
| මුළු වටිනාකම | රු.1000000.00 |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>
ගරු සභාපතිතුමනි,ඇත්තටම ඇති හැකි අයත් නැති බැරි වුන යුගයක ගමක් තුළ තියෙන්නෙ කාටද නැත්තෙ කාටද කියලා වෙන් කරන්න බෑ.අපිට පේනවා රාජ්‍ය සේවයේ ඉන්න නිලධාරිත් ලොකු අපහසුතාවයකින් ඉන්නෙ කියලා.පඩි වැඩි වීමක්වත් නැතුව ලොකු ආර්ථික අර්බුධයකට පත් වෙලා තියනවා.අපි හැමදේම එක කොටසකට දෙනවා.චක්‍රලේඛයෙන් බැහැරව හරි සියලුම දෙනාට දෙනවානම් තමයි හොඳ.ඇත්තටම රජයේ නියුතු පිරිස් මෙවැනි නිර්නායක වලදි හැලෙනවා.ඔවුන්ට කිසිදු ආධාරයක්වත් මෙවැනි සහනයක්වත් ලැබෙන්නෙ නෑ.ඉල්ලන්නත් බෑ.ආයතනයක රාජකාරී කරනකොට ඒ අයගේ උත්සව වලට දානෙ ගෙදරට මඟුල් ගෙදරට යන්න ඕන.ඒ වගේම නිසා අධික වියදමක් දරන්න වෙනවා.සානුකම්පිතව හැමෝටම දෙන්න පුළුවන්නම් හොඳයි.සුදුසු ක්‍රමවේදයකට සියලු දෙනාට දෙනවනම් තමයි සුදුසු කියලා මං ප්‍රකාශ කරනවා.

<u>ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා</u>
ගරු සභාපතිතුමනි,ඇත්තටම සමන් මන්ත්‍රීතුමා කිව්වා වගේ අපි සියලු දෙනා අත් දෙකම උස්සනවා අපේ බල ප්‍රදේශයේ සියලු දරුවන්ට මේක දෙන්න පුළුවන්නම්.මේ තියන චක්‍රලේඛ අනුව සියලු දෙනාම දන්නවා රජයේ රස්සාවක් කරන කෙනෙක්ට රජයේ කිසිදු දීමනාවක් හෝ ආධාරයක් දෙන්න බෑ කියලා.ග්‍රාම නිලධාරි සහතිකයක් අරගෙන නිසි ක්‍රමවේදයකට ගිහිල්ලා අඩු ආදායම්ලාභී කියලා බලන්නැතුව එක්කො පවුලෙ ඉන්න ළමයි ගාන සැලකිල්ලට අරගෙන එක ළමයෙකුට හරි දෙන්නෙකුට හරි සහනයක් දෙන්න බලන්න.එහෙම නැත්තම් රජයේ විශේෂ අනුමැතියකට යටත්ව කරන්න පුළුවන්.මේක බෙදුමකට ගිහිල්ලා කල් දාන්නෙ නැතුව කරන්න පුළුවන් නම් හොඳයි.අඩුම ගානෙ එක ළමයෙකුට හරි මේ සහනය දීම වලක්වන්නෙ නැතුව මේකට සහයෝගය දීලා හැම ගමකම අඩු ආදායම්ලාභීන් කවුද කියලා අඳුනගෙන කරන්න ඕන.සමෘද්ධි කියන කාරණාව එක නිර්නායකයක් විතරයි.වැටුප් පරිමාණයක් දාලා වැටුප් පරිමාණය මෙච්චරක් මුදලකින් ඉහල අයට කියලා හෝ මෙච්චරක් මුදලකින් පහල අයට කියලා ගත්තම සමහර රජයේ සේවකයොත් ඒ සනයට වැටෙනවා.ත්‍රිවිධ හමුදාව නියෝජනය කරන අයට එහෙම දීමනා ලැබුණු අවස්ථා තියනවා.ඒ ගැන තියන නීතිමය තත්ත්වය බලන්න.ඉතාමත් කාලෝචිත හොඳ යෝජනාවක් විදියට මං මේක දකිනවා.ස්තූතියි.

ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
සභාපතිතුමනි,මේ ඉතාම හොද යෝජනාවක් පුළුවන්නම් මේ යෝජනාව ලක්ෂ 20 දක්වා වැඩි කරන්න කියලා ඉල්ලීමක් කරනවා.ඒ වගේම තමයි අපේ මන්ත්‍රීතුමාලා මතක් කලා රජයේ සේවකයො ගැන ඇත්තටම ඒ කතාව ඇත්ත.ඔවුන් ලොකුම අපහසුතාවයකට පත් වෙලා ඉන්නේ.මාලිම්බඩ සම්බන්ධීකරණ කමිටුවෙදි හතර වටින් ගංවතුර ගලලා තියන වෙලාවේ මං ඉල්ලීමක් කලා එදා පුළුවන්නම් රජයෙ සේවකයෝ යැයි නොසලකා හැමෝටම මේ ආධාර මුදල් දෙන්න කියලා.ඒත් එහෙම වුනේ නෑ.පඩිය මදි වුණත් රජයේ සේවකයො කියන ලේබලය අපිට තියනවා.කොවිඩ් වෛරසය ආපු වෙලාවේ ඒ චක්‍රලේඛය අභිබවා හැමෝටම රු10,000.00 බඩු මල්ල දෙන්න පුළුවන් වුණා.හැබැයි මේකට සාධනීය පිළිතුරක් ලසන්ත මන්ත්‍රීතුමාගෙන් ලැබුණා.ඒ තමයි පවුලක ඉන්න ළමයි සංඛ්‍යාව අනුව.මාලිම්බඩ ළමයි තුන් දෙනෙක් හතර දෙනෙක් ඉන්න පවුල් තියෙන්නේ ඉතාම අඩු ප්‍රමාණයක්.ඒ නිසා අපිට පහසු වේවි.අද පාසල් උපකරණ ගන්න බැරිව අඩන ප්‍රමාණය වැඩියි.දෙන්න පුළුවන් දේ හැමෝටම දෙන්න පුළුවන් නම් හොදයි.කෙසේ වෙතත් ඉතා කෙටි කාලයයි අපිට තියෙන්නේ.හැකි ඉක්මනින් කටයුතු සම්පාදනය කරලා ඵලදායි ලෙස දරුවන්ට මේ පහසුකම සපයන්න කියලා මං ඉල්ලීමක් කරනවා.ස්තුතියි.

ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා
ඉතාම හොද යෝජනාවක් මේක පොත්පත් ලැබිය යුතු මට්ටමේ දරුවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා කියලා සභාපතිතුමා ඇතුළු සියලු දෙනාට අවබෝධ වීම සම්බන්ධව සන්තෝෂයි.ලොකු පිරිසක් කෑම බීම නැතුව පොත්පත් ගන්න විදියක් නැතුව ඉන්නවා.මේකට අපෙත් අකමැත්තක් නෑ.යහපත් චේතනාවෙන් ඉදිරිපත් කරත් මේකේ පැහැදිලි ඇස්තමේන්තුවක් නෑ.විනිවිදභාවයක් නෑ.මං යෝජනා කරනවා මේක ඉදිරි සභාවකට කල් දාලා අදාළ නිලධාරි මැදිහත් කරගෙන කොට්ඨාශෙ දෙන්න සුදුසු අය කවුද කියලා අදුරගන්න කියලා.එතකොට අපිටත් මේක අනුමත කරන්න පුළුවන්.එහෙම නැතුව මට එකඟ වෙන්න බෑ.මේ යෝජනාව මගේ ඉල්ලීම පරිදි ගෙවීම් කරන සිසුන් කවුද කියලා ග්‍රාම නිලධාරින්ගෙන් හරි ලබාගෙන ලබන සභාවකට ඉදිරිපත් කරන්න කියලා මං ඉල්ලීම් කරනවා.එහෙම වුනොත් මං මේකට කැමැත්ත ප්‍රකාශ කරනවා.නැත්තම් මං මේකට බෙදීමක් ඉල්ලනවා.මං ඒකට විරුද්ධව ඡන්දය පාවිච්චි කරනවා.

ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
ඇත්තටම ඉතාම හොඳ යෝජනාවක්.මං දකිනවා මේක වෙනස් ආකාරයකට කරානම් හොදයි කියලා.ගරු සභාපතිතුමනි ගමක ඉස්කෝල බැලුවොත් උතුරු මාලිම්බඩ ළමයි එකසිය ගාණයි ඉන්නේ.දම්පැල්ලෙ 100ක් වගේ.අප බල ප්‍රදේශයේ තියෙන්නෙ ළමයි අඩු ප්‍රමාණයක් ඉන්න පාසල්.වැඩියෙන්ම ඉන්නෙ තෙලිජ්ජවිල සෙන්ට්‍රල් එකේ. බල ප්‍රදේශයෙන් පිට ළමයි ගොඩක් ඒකෙ ඉන්නවා.රාජකීයෙත් ඒ වගේ.ඒවටත් දෙන්න ඕන ඒත් ඒවගෙ ඉන්නෙ ගොඩක් පිට ළමයි.පාසල් 15ක් විතර වගේ තියෙන්නෙ බල ප්‍රදේශයේ පාසල් ඒවා සන්සන්දනය කරලා බැලුවම ළමයි 5000ක් විතර වගේ තමයි ළමයි ඉන්නේ.ඒ අය තෝරගෙන පාසල් වලට ලබා දුන්නානම් අපේ සභෘවට මීට වඩා හොඳ ගරුත්වයක් ලැබෙනවා.අපි මැදිහත් වෙන්න ඕන නෑ.ඒ නිසා පාසල් මට්ටමින් ලබා දෙන්න කියලා තමයි මගේ යෝජනාව.බොහොම ස්තූතියි.

ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
සභාපතිතුමනි මේ ඉතාම හොද යෝජනාවක් මේක.නිලන්ත මන්ත්‍රීතුමා කියපු විදියට කල් දදා හැකියාවක් නෑ මොකද දරුවන්ගේ අධ්‍යාපනය හා පළමු පාසල් වාරය පටන් ගෙන තියන මොහොතක.අපිය පුළුවන් මේ සත්ක්‍රියාව කරන්න හොඳ විනිවිදභාවයකින්.මේවගෙ බිල්පත් ටික හරියට ඉදිරිපත් කරන්න පුළුවන්නම් නිවැරදිව තෝරා ගැනීම් කරන්න පුළුවන්නම් මං හිතන්නේ මේක අකටයුත්තක් වෙන එකක් නෑ.හේතුව අපිට පුළුවන් ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් සංවර්ධන නිලධාරින් හරහා අඩු ආදායම්ලාභී දරුවන් සදහා පමණක් නිසා ඒ අයව තෝරා ගන්න පුළුවන් නිවැරදි ක්‍රමවේදය හදාගන්න.මොකද පාසල් මට්ටමින් කරලා මේක හැමෝටම දෙන්න පුළුවන් හැකියාවක් නෑ සභා අරමුදලින් කරන නිසා.අදටත් අපෙන් මිනිස්සු

අහනවා සභාව මඟින් පොත්පත් දෙනවද කියලා.අපි ඒ අයට දීපු පිළිතුර තමයි මේ වනතෙක් එහෙම සභාවෙන් වැඩසටහනක් ක්‍රියාත්මක නොවන බව.නමුත් ඔබතුමා කරන යෝජනාව එක්ක දුප්පත් අහිංසක ඉගන ගන්න පුළුවන් හැකියාව තියන දරුවන්ට මේ අවස්ථාව ලබා දීලා ඔවුන්ව ධෛර්යමත් කරලා ඒ දරුවන්ගේ අධ්‍යාපනය සාර්ථක මඟක් කරා යොමු කරන්න පුළුවන් නම් වටිනවා.හැමෝටම තියන ප්‍රශ්නය තමයි මේ හරහා මුදල් ගසා කෑම්,කොමිස් ගැහිලි සිදුවෙයි කියන කාරණය ඒ නිසා තමයි මේකට විරුද්ධ වෙන්නේ.නිලන්ත මන්ත්‍රීතුමත් මේ සත්ක්‍රියාවට කැමතියි.මේක පැහැදිලිව කරන්න කියලා තමයි කල් දාන්න කියන්නේ.මං එතුමගෙනුත් ඉල්ලන්නෙ මේක පසුවට කල් දාන්න දෙයක් නෙවෙයි.අවශ්‍ය දේ අවශ්‍ය තැනදි කරන්න පුළුවන් ක්‍රමවේදයක් තමයි හදන්න ඕන.ඒක හරියට කරලා මේ වැඩසටහන සාර්ථක කරගන්න කියලා ඉල්ලනවා බොහොම ස්තූතියි.

ගරු සභාපති සෝමසිරි වීරමන් මයා

අපි මේ ආවට ගියාට කරන දෙයක් නෙවෙයි.2022.12.14 පළාත් පාලන කොමසාරිස්තුමා අපිට ලියුමක් එවලා තියනවා 60%ක් දක්වා වියදම් කරන්න කියලා.10%ක පාසල් යන ළමයින්ට පාසල් උපකරණ ලබාදෙන්න කියලා.ලියුම මං ළඟ තියනවා.ඊළඟට ප්‍රජා සංවර්ධන නිලධාරිනියට මේක භාර දෙනවා.එතුමිය ඇස්තමේන්තුවක් හදලා තියනවා අඩු ආදායම්ලාභී දරුවන්ට රු.1000.00ක පාසල් උපකරණ කට්ටලයක් ලබා දෙන්න.ප්‍රශ්ණයක් තියනවා නම් කමිටුවක් පත් කරලා කරන්න පුළුවන්.පළාත් පාලන කොමසාරිස්තුමාගෙ අනුමැතියත් ලැබිලා තියනවා.

ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා

සභාපතිතුමනි මේ ඉතාම හොද යෝජනාවක් මේක.නාලක මන්ත්‍රීතුමා කිව්වා පාසල් මට්ටමින් දෙන්න කියලා.මං උදාහරණයක් කියන්නම් මගේ දරුවගෙ පන්තියේ දරුවෙක් ඉන්නවා තාත්තා නැති වෙලා.පාලටුව ඉස්කෝලෙට යන්නේ.සෙරිප්පු දාගෙන පාසල් යන්නෙ.පාසල් මට්ටමින් දෙන්න ගියොත් අපේ කොට්ඨාශෙ දරුවන් මඟ ඇරෙනවා.ඒ නිසා මං කියනවා පුළුවන් ඉක්මණට මේ යෝජනාව හරි ක්‍රමවේදයකට ක්‍රියාත්මක කරන්න කියලා.

ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

සභාපතිතුමනි මේ ඉතාම හොද යෝජනාවක්.මගේ පූර්ණ සහයෝගය ලබා දෙනවා.මාත් ඉල්ලීමක් කරනවා මේ මුදල දෙගුණයක් කරන්න කියලා.මොකද අකුරැස්ස හා වැලිගම බල ප්‍රදේශයේ මේක කරලා තියනවා.දුප්පත් ළමයි ඉන්නවා පොත් ටික ගන්න බැරුව.ළමයි තෝරගන්න ක්‍රියාවලිය සුදුසුම ආකාරයකට කරන්න කියලා ඉල්ලනවා.රජයේ නිලධාරින්ට මේක භාර දෙන්න.අත්‍යවශ්‍යම ළමයි තෝරලා කඩිනමින් මේක ආරම්භ කරන්න.

ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

ගරු සභාපතිතුමා,මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි.සභාපතිතුමා ඉතා හොඳ යෝජනා ඉදිරිපත් කරනවා.සමහර යෝජනා ක්‍රියාත්මක කරන්න බැරි වෙලා තියනවා.කෘෂිකර්ම උපකරණ දෙන්න හැදුවා ඒකෙ ගැටලු ආවා.කරගන්න බැරි වුණා.පෝෂණ තත්ත්වය ඉහළ නංවන්න ජංගම සේවයේදි එතුමා ප්‍රකාශයකුත් කරා බිත්තර ලබා දෙන්න.හැබැයි අපිට එක බිත්තරයක්වත් දෙන්න බැරි වුණා.විදුලිබිල වැඩි කිරීමෙදි පන්සල් වලට රු.5000ක් දෙන්න හැදුවා ඒක කරගන්න බැරිවුණා.මේ යෝජනාව නම් පරක්කු වැඩියි.මේ වනවිට ක්‍රියාත්මක වන තැනට පත් වන්නට තිබුණා.අර වගේ ගැටලු වලට පත් නොවී මේකෙදි මං දකින ප්‍රධානම ගැටලුවක් තියනවා මේ කියන ඇස්තමේන්තුව අනුව එක ග්‍රාම නිලධාරි වසමකට ළමයි 30කටයි දෙන්න පුළුවන්.කොට්ඨාශයට ළමයි 100යි.ග්‍රාම නිලධාරි වසම් 3ක් තියන එකක් වුණොත් ළමයි 30යි.හොරගොඩ බටහිර වගේ වසමක අඩු ආදායම්ලාභී පවුල් වැඩි වෙන්න පුළුවන්.අධිකාරිවිල වගේ ගමක ළමයි අඩු වෙන්න පුළුවන්.කොට්ඨාශ වලට බෙදිලා එනකොට ආර්ථික මට්ටමින් අඩු ළමයි ඉන්න කොට්ඨාශ වල ලොකු අපහසුතාවයකට පත් වෙනවා.ඒ වගේම මේ වන විට මේක කරන්න නම් ඒ ප්‍රදේශවල ආර්ථික මට්ටම අඩු ළමයිගෙ

තොරතුරු අරගෙන තියෙන්න ඕන.ගිය අවුරුද්දෙ ළමයි 885 දෙනෙකුට පොත් ලබා දුන්නා ඒ දුන්නෙ ළමයිගේ ශ්‍රේණියට අදාළ පොත් ටික.එහෙම නැතුව අඩු ආදායම්ලාභි පවුලක 6 පන්තියේ ඉන්න ළමයෙකුට CR පොත් දුන්නොත් වැඩක් නෑ.ඒවා අවශ්‍ය ළමයින්ට තමයි ඒක දෙන්න ඕන.මේ වනවිට ඒවා ලබාගෙන නැති බවයි පෙනී යන්නේ.මේක කඩිනමින් කරලා ළමයිට පොත්ටික දුන්නට දෙනවානම් අපි මොන අධිභාරයකට වුණත් කැමතියි.තොරතුරු ලබා නොගෙනීම හා සූදානමක් නොමැතිකම නිසා මේක කඩිනමින් ක්‍රියාත්මක කරන්න හැකියාවක් නැතිබව පෙනී යනවා.මේකට අපේ සහයෝගය ලබා දෙනවා හැබැයි කොට්ඨාශයකට ලැබෙන ගාන සීමා කරන්නැතුව.උදාහරණයක් විදියට හොරගොඩ කොට්ඨාශයට ළමයි 100කට වැඩිය හිටියොතින් ඉතුරු ළමයි ටිකටත් ලබා දෙන්න එකඟතාවයක් තියෙන්න ඕන.නැත්තම් ටිකකට දීලා මන්ත්‍රීවරුන්ට ගමේ ඉන්න බැරිවෙනවා.අනිත් සභාවල් මේ වන විට මේක ක්‍රියාත්මක කරලා තියනවා.අපි ලැජ්ජා වෙන්න ඕන අපි මේවනතෙක් මේක ක්‍රියාත්මක කරන්න බැරිවීම ගැන.මේ තොරතුරු ලබා ගන්න මන්ත්‍රීවරු විදියට අපේ පූර්ණ සහයෝගය නිලධාරින්ට ලබා දෙනවා.මං ළඟ හොරගොඩ සියලු පවුල් වල නාම ලේඛණයක් තියනවා.ඒ වගේ හොඳ වැඩපිළිවෙලක් එක්ක මේ වැඩේ කඩිනමින් කරන්න කියලා ඉල්ලනවා.ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය</u>

සුභ නව වසරක් සියළු දෙනාටම.සභාපතිතුමාගේ යෝජනාව ඉතාම කාලෝචිතයි.නමුත් ප්‍රශ්න රාශියක් ඇති වෙන්න පුළුවන්.අපි මේ වගේ මීට කලින් දීලා තියනවා.ඇත්තටම දෙන්න ඕන.අනිත් එක මේ පාසල් වාරයේ පළමු වාරය නෙවෙයි තුන්වන වාරය.පළමු වාරය පටන් ගන්නෙ මැයි මාසයේ.ඇත්තටම මං සතුටු වෙනවා මේ යෝජනාව මේ යෝජනාව හරියට දාලා දෙන්නෙ කාටද කියලා නිශ්චිතව හඳුනාගෙන ගැටලු හඳුනාගෙන ඒවට විසඳුම් දීලා ලබන මාසෙට කල් තියනවා නම් හොඳයි.දෙන්න ගියාම ග්‍රාම නිලධාරින්ගෙන් ගත්තත් අපිට එකම ලිස්ට් එකක් එන්නේ අඩු ආදායම්ලාභී කිව්වම.රජයේ සේවයේ ඉන්න පවුලෙ දරුවන් 3දෙනා හෝ 4දෙනා ඉන්න පවුල් වලටත් ලබා දුන්නොත් හොඳයි කියලා හිතනවා.ප්‍රශ්න අවම වන විදියට සභාවේ ගරුත්වය රැකෙන විදියට හැම පීඩිත දරුවෙක්ටම ලැබෙන විදියට මිනිසුන්ට උදව්වක් වෙන්න තමයි ඕන.මේක සාර්ථක ලෙස ලබන සභාවට ඉදිරිපත් කරන්න කියලා මාත් ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා</u>

මේ ආර්ථික අර්බුධයෙන් දරුණුම මරු පහර එල්ල වුණේ දරුවන්ට.පාසල් යන්න බැරි ආහාර වේල සපයා ගන්න බැරි පාසල් උපකරණ ටික ගන්න බැරි තත්ත්වයක ඔබතුමා මේ යෝජනාව ගෙනාවට ස්තූති වන්ත වෙනවා.මං මේ යෝජනාවේ අඩුපාඩුවක් දකින්නේ නෑ.නිලන්ත මන්ත්‍රීතුමා කිව්ව වගේ නිර්නායක වල අඩුවක් තමයි තියෙන්නේ.මං දැක්කා ලසන්ත මන්ත්‍රීතුමා හොඳ නිර්නායකයක් ඉදිරිපත් කලා.අපි ගමු පවුල්වල ඉන්න ළමයි ප්‍රමාණය.මේක කල් දාන්න නෙවෙයි මේක ක්‍රියාත්මක කරන්න පුළුවන් තරමේ නිර්නායක තියනවා නම් සලකලා බලලා ගමකට ඉන්නවා රජයේ නිලධාරින් 4 දෙනෙක් පත් කරලා. කිසි ගැටලුවක් නෑ.ඒ අයත් සම්බන්ධ කරගෙන ක්‍රියාත්මක කරන්න කරන්න කියලා මං ඉල්ලා සිටිනවා.

<u>ගරු මන්ත්‍රී පිටිදුව ගමගේ විමලවංශ මහතා</u>

සභාපතිතුමනි  මෙ යෝජනාව ඉතාම කාලෝචිතයි.මං හිතන්නේ මේ යෝජනාව ක්‍රියාත්මක කිරීමට නාලය හරස් වෙනවා කියලා.දැන් පණිවිඩයක් ආවා 21 හවස නාමයෝජනා භාරගෙන අවසන් කරනවා කියලා.එතකොට රජයේ හෝ පෞද්ගලික ප්‍රතිදාන ආධාර නවත්වන්න වෙනවා.මැතිවරණ සමයක මේවගේ බෙදා හරින්න බෑ.සභාව කියන්නේ රජයේ ආයතනයක්.ඒ නිසා මන්ත්‍රීවරු කිව්ව වගේ කලින් ගන්න තිබුණු යෝජනාවක්.මොකදද මිලදී ගැනීම් කරන්න ,ගෙවීම් කරන්න ටෙන්ඩර් පටිපාටියකට යන්න වෙනවා.අකුරැස්ස සභාව මිලදී ගැනීම් කරලා තියනවා.ඒ නිසා ඒ නිලධාරින් බරපතල ප්‍රශ්නයකට පත්වෙලා තියනවා.මොකද මිල ගනන් කැඳවීමකින් තොරව අරගෙන තියනවා.නිර්නායක තිබුණට බොහොම හොඳ

යෝජනාවක්.අපි කරපු දෙයක්.මේකට සභාපතිතුමා මැතිවරණ සමයේ කරන එකට අපි කැමති නෑ.මොකද රජයේ දේපළ වලින් කවුරුහරි දේශපාලන වාසි ගන්න හදනවා නම් අපි ඒකට කැමති නෑ.දැන් මැතිවරණ සමයක් ආපු නිසා වඩාත් බරපතලයි මේක.මං නිලධාරින්ගෙන් ඉල්ලා සිටිනවා මිලදීගැනීම් කරනකොට නිසි ක්‍රමවේදයකට කරන්න කියලා.මේක මීට කලින් ගේන්න තිබුණු යෝජනාවක්.ලසන්ත මන්ත්‍රීතුමා කිව්වා වගේ විවේචනය කරන්න බැරි නිර්නායක යොදාගෙන කරන්න මොකද ගම් මට්ටමින් සමහර දේවල් වලට මන්ත්‍රීවරුන්ට විවිධ චෝදනා තියනවා.ඒ නිසා ඒක නොවෙන්න මේක ක්‍රියාත්මක කරන්න කියලා මං ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මයා</u>

මන්ත්‍රීවරුනි,සමහර අදහස් වල අර්ථයක් නෑ.මේක දේශපාලන ස්වරූපයක් ගත්ත ඒවා නෙවෙයි.මං කලින කිව්වා දෙසැම්බර් 14 ආණ්ඩුකාරතුමාගෙ අනුමැතිය ආවේ.අපිට ලියුම එනකොට දෙසැම්බර් 20 විතර ඇති. 60%දක්වා වියදම් කරන සීමාව 70% දක්වා වැඩි කරලා වැඩිවුණු 10% පාසල් උපකරණ ලබා දෙන්න අවසර දෙන්න කියලා හැම සභාවකින්ම ඉල්ලීමක් කරලා තියනවා.අපි මේක සැලැස්මක් මත ප්‍රජා සංවර්ධන නිලධාරිතුමියට භාර දෙනවා.සියලු පාසල් වලින් අපි මූලික දත්ත පද්ධතියක් ලබා ගන්නවා.ඒ වගේම තමුන්නාන්සේලාගෙන් ප්‍රකාශ වුණා අකුරැස්ස ප්‍රශ්නයක් වුනා කියලා.ඒක ප්‍රමාණය ඉක්මවලා හිතාමතා කරපු දෙයක්.සභාව අනුමත කරපු පලියට දෙන්නෙ නෑ.එංහම දෙන්න බැහැ.යෝජනා සම්මත කරලා පළාත් පාලන කොමසාරිස්තුමාට අනුමැතියට යවන්න ඕන.බජට් එකකින් මුදල් වෙන් කරපු ප්‍රමාණයකුත් තියෙන්න ඕන.ඒකයි මං කිව්වෙ ලක්ෂ 20 දක්වා වැඩි කරන්න පුළුවන් කියලා.අකුරැස්ස ප්‍රශ්නය අනුමැතිය නොගෙන කරපු දෙයක්.අපි එහෙම නෙවෙයි අනුමැතියක් අරගෙන කරන්නේ.ඒ වගේම දේශපාලන ස්වරූපයක් මේකෙ නෑ.විසිරුවා හැරිය කියලා ප්‍රශ්නයක් නෑ.සම්මත වුණාට පස්සෙ අපි හිටියත් නැතත් මේ කටයුත්ත කෙරේවි.20 වෙනිදා නාමයෝජනා භාරගෙන අවසන් වුණා කියලා මේක නතර වෙන්නෙ නෑ.ඒක නිලධාරින්ට කරන්න පුළුවන්.මට හරි කණගාටුයි නිර්ධන පන්තිය වෙනුවෙන් හඬ නඟන අයත් මේක කල් දාන්න කියපු එකට.තව ප්‍රශ්නයක් තමයි විෂය නිලධාරින්ගෙන් දිගින් දිගටම අහන එක රජයේ නිලධාරින්ට බීජ පැකට් දුන්නද කියලා.විගණනයෙන් අහන්නේ.අපි දුන්නත් වැරැද්දක් තියනවද ඒ මිනිස්සුත් වගා කරනවනෙ.බීජ පැකට් එකක් කියන්නේ සුළු මුදලක්නෙ.ඒ වගේ තත්ත්වයක් තියෙන්නෙ.බීජ පැකට් එකක් රජයේ සේවකයන්ට දුන්නා කියලා එහෙම නම් පොත් ටිකක් දුන්නනම් කොහොම කරාවිද.සභාව අහුවෙනවා වැරදි තීරණයක් ගත්ත කියලා.කිසිම ප්‍රශ්නයක් නොවෙන විදියට අපි පැහැදිලිව කරනවා.මිල ගණන් කමිටුව ඒවා ඒ විදියට කරයි.අපිට පුළුවන් පළමු අදියර විදියට 1-5 වසර තෝරාගෙන දෙන්න.එතකොට ඔක්කෝටම දෙන්න පුළුවන්.අදහසක් මං මේ කියන්නේ.ඉතුරු වුණොත් 1-7 වසර වලට පුළුවන්.මාලිම්බඩ ග්‍රාම නිලධාරි තහවුරු කරන අයට විතරයි දෙන්නේ.මන්ත්‍රීවරු හවුල් වෙන්නෙ නෑ.අපිට චක්‍රලේඛයෙ ඇවිල්ලා තියෙන්නේ කොට්ඨාශ මන්ත්‍රීවරුන්ගේ නිර්දේශය මත කරන්න කියලා.නමුත් අපි ග්‍රාම නිලධාරි අනුමැතියට තමා දෙන්නෙ.කිසිම දේශපාලන ස්වරූපයක් නෑ.මේක සත්භාවයෙන් කරන්නෙ.අපි ගියත් ලේකම්තුමිය,ප්‍රජා සංවර්ධන නිලධාරිතුමිය මිලගණන් ලබාගන්න සංජීව මහත්මයා ඉන්නවා.ඒ අය මේක හරියට කරාවි කියන විශ්වාසය අපිට තියනවා.නිලන්ත මන්ත්‍රීතුමා බෙදීමක් අවශ්‍යයි නම් කියන්න බෙදීමක් දෙන්නම්.

ඒ වගේම තමයි උදයසාන්ත මන්ත්‍රීත්මා ප්‍රකාශ කලා එක් පවුලකට බිත්තර 50ක් දෙනවා කියලා ජංගම සේවයේදි ප්‍රකාශ කලා කියලා.අපි එහෙම කරන්න තමයි හිටියේ.අපි ප්‍රචාරය කලා මන්ද පෝෂණයට ලක්ව ඇති අය ඉන්නවා නම් ජංගම සේවයට ඇවිත් නම් දෙන්න කියලා.නමුත් ජංගම සේවයේදී එහෙම එකම නමක්වත් ලැබුනේ නෑ.ඒ වගේම විහාරස්ථාන වල විදුලි බිලෙන් කොටසක් සභාව මඟින් දෙන්න යෝජනාවක් ගෙනාවා උදයසාන්ත මන්ත්‍රීතුමා ඇතුළු කීපදෙනෙක් එම යොජනාවට කැමති නැති බව ප්‍රකාශ කලා.ඒ ගැන හිතලා

තමයි මම සභාව මඟින් වෙන් කල නැති සියලු මුදල් පාසල් පොත් ලබා දෙන්න තීරණය කලේ.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලන ලදුව ඡන්දය විමසන ලදී.එහිදී පහත නම් සඳහන් ගරු සභාපතිතුමා ඇතුළු ගරු සභික මහත්ම මහත්මීන් යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

- ගරු සභාපති සෝමසිරි වීරමන් මහතා
- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා
- ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා
- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා
- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
- ගරු මන්ත්‍රී ගයාන් සමන්ත නාදකන්ද මහතා
- ගරු මන්ත්‍රී දිස්නා ධර්මවර්ධන මෙනවිය
- ගරු මන්ත්‍රී රචිත මොහොට්ටි මහතා
- ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා
- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
- ගරු මන්ත්‍රී පිටිදුව ගමගේ විමලවංශ මහතා
- ගරු මන්ත්‍රී ඒ.එච්. නිරෝෂා පුෂ්පාදරී මිය
- ගරු මන්ත්‍රී ආර්.ජී. හර්ෂණී ගුණසේකර මිය
- ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය
- ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා

පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

- ගරු මන්ත්‍රී ආර්.කේ. නිලන්ත ධම්මජිත් මහතා

ඒ අනුව වැඩි ඡන්ද 15කින් එම යෝජනාව සභා සම්මත විය.

ඉහත යෝජනාව ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම මත සභාපතිතුමා විසින් පහත සඳහන් ආකාරයට සංශෝධනය කර නැවත සභාවට ඉදිරිපත් කරන ලදී.

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලු පාසල් සහ පිටස්තර පාසල් වල බල ප්‍රදේශයේ සිසුන් නියෝජනය වන පරිදි අදාල පාසලේ විදුහල්පති නිර්දේශ කරනු ලබන දරුවන්ගේ නාම ලේඛනය හෝ බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගේ නිර්දේශය අනුව 1-5 ශ්‍රේණි වලට ඇතුළත් දරුවන්ගේ නාම ලේඛන පදනම් කර ගනිමින් පාසල් උපකරණ බෙදා දීම සඳහා රු ලක්ෂ 20ක් සභා අරමුදලින් දැරීමට ගරු සභාවට යෝජනා කරමි.

<u>**තීරණ අංක 5:8**</u>

මාලිම්බඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සියලු පාසල් සහ පිටස්තර පාසල් වල බල ප්‍රදේශයේ සිසුන් නියෝජනය වන පරිදි අදාල පාසලේ විදුහල්පති නිර්දේශ කරනු ලබන දරුවන්ගේ නාම ලේඛනය හෝ බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිගේ නිර්දේශය අනුව 1-5 ශ්‍රේණි වලට ඇතුළත් දරුවන්ගේ නාම ලේඛන පදනම් කර ගනිමින් පාසල් උපකරණ බෙදා දීම සඳහා රු ලක්ෂ 20ක් සභා අරමුදලින් දැරීමට තීරණය විය.

## 6. යථා පරිදි කල් දී නොමැති යෝජනා.

**යෝජනා අංක 6:1**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු 252-6517 අංක දරණ කැබ් රථය නියෝජිත ආයතනය වෙත යොදවා අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:1**

මාලිම්බඩ ප්‍රාදේශීය සභාව සතු 252-6517 අංක දරණ කැබ් රථය නියෝජිත ආයතනය වෙත යොදවා අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 6:2**

පහත සදහන් කර්මාන්ත වල ගිවිසුම් කාලය කල් ඉකුත් වී ඇති බැවින් එම ගිවිසුම් අවලංගු කිරීම සුදුසු බවටත් ඒ සදහා අළුතින් ගිවිසුම් ගතවීම සුදුසු බවටත් ගරු සභාවට යෝජනා කරමි.

| කර්මාන්තය | ගිවිසුම් ගත දිනය | ගිවිසුම් අවලංගු වන දිනය |
|---|---|---|
| මාලිම්බඩ පොළ ඉහළ මාලය ඉදිකිරීම | 2021/11/30 | 2022/12/31 |
| ගල්ඇන්ද කුට්ටිය ප්‍රජා ශාලාව ඉදිකිරීම | 2021/11/29 | 2022/12/31 |
| තෙලිජ්ජවිල පොළ පැතිබැම්ම ඉදිකිරීම | 2021/08/02 | 2022/12/31 |
| ප්‍රාදේශීය සභාව සතු වාහන නතර කර තැබීමට ආරක්ෂිත වාහන අංගනයක් ඉදිකිරීම | 2021/12/22 | 2022/12/31 |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:2**

පහත සදහන් කර්මාන්ත වල ගිවිසුම් කාලය කල් ඉකුත් වී ඇති බැවින් එම ගිවිසුම් අවලංගු කිරීම සුදුසු බවටත් ඒ සදහා අළුතින් ගිවිසුම් ගතවීම සුදුසු බවටත් තීරණය විය.

| කර්මාන්තය | ගිවිසුම් ගත දිනය | ගිවිසුම් අවලංගු වන දිනය |
|---|---|---|
| මාලිම්බඩ පොළ ඉහළ මාලය ඉදිකිරීම | 2021/11/30 | 2022/12/31 |
| ගල්ඇන්ද කුට්ටිය ප්‍රජා ශාලාව ඉදිකිරීම | 2021/11/29 | 2022/12/31 |
| තෙලිජ්ජවිල පොළ පැතිබැම්ම ඉදිකිරීම | 2021/08/02 | 2022/12/31 |

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු වාහන නතර කර තැබීමට ආරක්ෂිත වාහන අංගනයක් ඉදිකිරීම | 2021/12/22 | 2022/12/31 |

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:3</u>**
පහත සදහන් මාර්ග සංවර්ධනය කරදෙන ලෙස සභාවට යෝජනා කරමි.

I. මහකුට්ටිය පාර
II. අලස්වත්ත කද්දුව ගෙදර අසල සිට ඉදිරියට මාර්ගය

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:3</u>**

පහත සදහන් මාර්ග සංවර්ධනය කිරීමට තීරණය විය.

I. මහකුට්ටිය පාර
II. අලස්වත්ත කද්දුව ගෙදර අසල සිට ඉදිරියට මාර්ගය

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:4</u>**
2023 වර්ෂයේ ටෙන්ඩර් නොවූ පොදු දේපල පහත සදහන් අවම ලංසු මුදල් යටතේ නැවත ටෙන්ඩර් කිරීම සඳහා ගරු සභාවට යෝජනා කරමි.

| නම | අවම ලංසුව | තැම්පතුව | පෝරම ගාස්තු |
|---|---|---|---|
| මාලිම්බඩ පොදු වෙළදපොළ | 268800.00 | 5000.00 | 250.00 |
| හොරගොඩ පොදු වෙළදපොළ | 10200.00 | 1000.00 | 250.00 |
| ශාන්තිවත්ත ඉඩමේ තාවකාලික බෝග වගාව(වසර 03) | 19125.00 | 1000.00 | 250.00 |
| සෙන්ට්‍රල් පාර්ක් ඉඩමේ රබර් කුරුඳු එලදාව(වසර 03) | 96900.00 | 1000.00 | 250.00 |
| පරණවත්තහේන ඉඩම | 2125.00 | 500.00 | 250.00 |
| තෙලිජ්ජවිල පොදු වැසිකිලි පද්ධතිය | 4250.00 | 500.00 | 250.00 |
| මාලිම්බඩ පොදු වැසිකිලි පද්ධතිය | 2125.00 | 500.00 | 250.00 |

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:4</u>**

2023 වර්ෂයේ ටෙන්ඩර් නොවූ පොදු දේපල පහත සදහන් අවම ලංසු මුදල් යටතේ නැවත ටෙන්ඩර් කිරීම සඳහා තීරණය විය.

| නම | අවම ලංසුව | තැම්පතුව | පෝරම ගාස්තු |
|---|---|---|---|
| මාලිම්බඩ පොදු වෙළඳපොළ | 268800.00 | 5000.00 | 250.00 |
| හොරගොඩ පොදු වෙළඳපොළ | 10200.00 | 1000.00 | 250.00 |
| ශාන්තිවත්ත ඉඩමේ තාවකාලික බෝග වගාව(වසර 03) | 19125.00 | 1000.00 | 250.00 |
| සෙන්ට්‍රල් පාර්ක් ඉඩමේ රබර් කුරුඳු එලදාව(වසර 03) | 96900.00 | 1000.00 | 250.00 |
| පරණවත්තහේන ඉඩම | 2125.00 | 500.00 | 250.00 |
| තෙලිජ්ජවිල පොදු වැසිකිලි පද්ධතිය | 4250.00 | 500.00 | 250.00 |
| මාලිම්බඩ පොදු වැසිකිලි පද්ධතිය | 2125.00 | 500.00 | 250.00 |

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:5</u>**

නඩු අංක L – 12569 නඩුව පැමිණිලිකරු විසින් ඉල්ලා අස්කර ගැනීමේ එකඟතාවය ලබා දී ඇති බැවින් ඒ සඳහා වියදම් වූ මුදල් පැමිණිලිකරුගෙන් ලබාගැනීමට හෝ එසේ නොමැතිව නඩුව ඉල්ලා අස්කර ගැනීමට එකඟතාවය ලබා දෙනවාද යන්න තීරණය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>තීරණ අංක 6:5</u>**

නඩු අංක L – 12569 නඩුව පැමිණිලිකරු විසින් ඉල්ලා අස්කර ගැනීමේ එකඟතාවය ලබා දී ඇති බැවින් ඒ සඳහා වියදම් වූ මුදල් නැවත ලබාගැනීමට හැකි උපරිම ප්‍රමාණය ලබාගැනීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:6</u>**

2022.11.08 පවත්වන ලද මහා සභා රැස්වීමේ යෝජනා අංක 6:2 යටතේ පී.ජී.එම්.අයි.අමරසේකර මහතාගේ ඉල්ලීම සම්බන්ධව කරන ලද ස්ථානීය පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන ලදී.ඒ අනුව පී.ජී.එම්.අයි.අමරසේකර යන අයට අයත් ඉඩමෙන් කොටසක් ප්‍රාදේශීය සභාව වෙත ලබා දී ප්‍රාදේශීය සභාව සතු ඉඩමෙන් කොටසක් ලබාගැනීම(හුවමාරු)සඳහා සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

**<u>තීරණ අංක 6:6</u>**

2022.11.08 පවත්වන ලද මහා සභා රැස්වීමේ යෝජනා අංක 6:2 යටතේ පී.ජී.එම්.අයි.අමරසේකර මහතාගේ ඉල්ලීම සම්බන්ධව කරන ලද ස්ථානීය පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන ලදී.ඒ අනුව පී.ජී.එම්.අයි.අමරසේකර යන අයට අයත් ඉඩමෙන් කොටසක් ප්‍රාදේශීය සභාව වෙත ලබා දී ප්‍රාදේශීය සභාව සතු ඉඩමෙන් කොටසක් ලබාගැනීම(හුවමාරු)සිදු කිරීම ප්‍රතික්ෂේප කරන ලදී.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**යෝජනා අංක 6:7**

හොරගොඩ නැගෙනහිර,හොරගොඩ බටහිර, හොරගොඩ දකුණ,ඇල්ගිරිය,පහළ කියාඩුව,සෙන්ට්‍රල් පාර්ක් ගම්මානය, ග්‍රාම නිලධාරි වසම් වල ජලනල එලීම සඳහා මාර්ගය පළුදු කිරීමට අවසර ලබා දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**තීරණ අංක 6:7**

හොරගොඩ නැගෙනහිර,හොරගොඩ බටහිර, හොරගොඩ දකුණ,ඇල්ගිරිය,පහළ කියාඩුව,සෙන්ට්‍රල් පාර්ක් ගම්මානය, ග්‍රාම නිලධාරි වසම් වල ජලනල එලීම සඳහා මාර්ගය පළුදු කිරීමට අවසර ලබා දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 6:8**

වාහන අංක YTS-6208 සිංගල් ඩ්‍රම් වයිබ්‍රේට්ට රෝලර්(ගල් රෝල) යන්ත්‍රය දැනට අක්‍රියව පවතින අතර,වැලිගම ප්‍රාදේශීය සභාව සමඟ අත් ට්‍රැක්ටර් එන්ජිමකට සුහද හුවමාරුවක් සඳහා යෝජිතව ඇත.එහි රක්ෂණාවරණය 2023.01.03 දිනෙන් අවසන් වන අතර පූර්ණ රක්ෂණාවරණය ලබා ගැනීමට රු.58525.00ක මුදලක් වැය වේ.එය සිදු කිරීම සඳහා සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**තීරණ අංක 6:8**

වාහන අංක YTS-6208 සිංගල් ඩ්‍රම් වයිබ්‍රේට්ට රෝලර්(ගල් රෝල) යන්ත්‍රය දැනට අක්‍රියව පවතින අතර,වැලිගම ප්‍රාදේශීය සභාව සමඟ අත් ට්‍රැක්ටර් එන්ජිමකට සුහද හුවමාරුවක් සඳහා යෝජිතව ඇත.එහි රක්ෂණාවරණය 2023.01.03 දිනෙන් අවසන් වන අතර පූර්ණ රක්ෂණාවරණය ලබා ගැනීමට රු.58525ක මුදලක් වැය වේ.එම නිසා එහි රක්ෂණාවරණය සිදු නොකිරීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 6:9**

හොරගොඩ ශ්‍රී වර්ධනාරාම විහාරස්ථානය අසල ගොඩනැගිල්ලක පවත්වාගෙන යන හොරගොඩ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි කාර්යාලය සේවා අවශ්‍යතාවය මත එම ස්ථානයේම පවත්වාගෙන යාම සඳහා මාලිම්බඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මගින් කළ ඉල්ලීම පිළිබඳ සුදුසු තීරණයක් ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

**තීරණ අංක 6:9**

හොරගොඩ ශ්‍රී වර්ධනාරාම විහාරස්ථානය අසල ගොඩනැගිල්ලක පවත්වාගෙන යන හොරගොඩ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි කාර්යාලය සේවා අවශ්‍යතාවය මත එම ස්ථානයේම පවත්වාගෙන යාම සඳහා මාලිම්බඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මගින්

කළ ඉල්ලීම අනුව එම ස්ථානයේම පවත්වා ගෙන යාම සඳහා අනුමැතිය ලබා දීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:10</u>**

2023 වර්ෂය වෙනුවෙන් පරිසණක,පරිසණක උපාංග,තොරතුරු තාක්ෂණය හා ඒ ආශ්‍රිත කටයුතු සම්බන්ධව කටයුතු සිදු කිරීම සහ තීරණ ගැනීම සඳහා පහත නම් සඳහන් නිලධාරින් තාක්ෂණ කමිටු නිලධාරින් ලෙස පත් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

I. එච්.එච්.අසංකා කුමාරි මිය - ලේකම්
II. දේශානි දිල්රුක්ෂි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
III. ප්‍රදීප් පුෂ්ප කුමාර මයා - සංවර්ධන නිලධාරී
IV. චරිත් මධුසංක - සංවර්ධන නිලධාරී

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:10</u>**

2023 වර්ෂය වෙනුවෙන් පරිසණක,පරිසණක උපාංග,තොරතුරු තාක්ෂණය හා ඒ ආශ්‍රිත කටයුතු සම්බන්ධව කටයුතු සිදු කිරීම සහ තීරණ ගැනීම සඳහා පහත නම් සඳහන් නිලධාරින් තාක්ෂණ කමිටු නිලධාරින් ලෙස පත් කිරීමට තීරණය විය.

I. එච්.එච්.අසංකා කුමාරි මිය - ලේකම්
II. දේශානි දිල්රුක්ෂි මිය - ප්‍රජා සංවර්ධන නිලධාරී
III. ප්‍රදීප් පුෂ්ප කුමාර මයා - සංවර්ධන නිලධාරී
IV. චරිත් මධුසංක - සංවර්ධන නිලධාරී

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:11</u>**

සුල්තානාගොඩ ගල්ළිඳ මන්සන්ධියේ සිට දිවෙන දිග්ගහවත්ත මාර්ගයේ ඉතිරි කොටස් සම්පූර්ණ කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී වසන්ත මුණසිංහ මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>තීරණ අංක 6:11</u>**

සුල්තානාගොඩ ගල්ළිඳ මන්සන්ධියේ සිට දිවෙන දිග්ගහවත්ත මාර්ගයේ ඉතිරි කොටස් සම්පූර්ණ කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:12</u>**

සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල මගින් එවා ඇති ENMT 01 IN 202258169 අංක හා 2023.01.04 දිනැති ලිපිය අනුව එහි සඳහන් හිඟ වාරික මුදල වන රු.685,052.53ක මුදල

ගෙවීමටත් ප්‍රාදේශීය සභා පනත,මූල්‍ය හා පරිපාලන රීති,මුදල් රෙගුලාසි ප්‍රකාරව අධිභාර මුදල වන රු.376,930.42ක මුදල මාලිම්බඩ ප්‍රාදේශීය සභාවට ගෙවීමට හැකියාවක් ඇත්නම් අධිභාරයත් ගෙවීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

ඉහත යෝජනාව පහත පරිදි සංශෝධනය කරන ලදී.

සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල මඟින් එවා ඇති ENMT 01 IN 202258169 අංක හා 2023.01.04 දිනැති ලිපිය අනුව එහි සඳහන් හිඟ වාරික මුදල වන රු.685,052.53ක මුදල ගෙවීමටත් ප්‍රාදේශීය සභා පනත,මූල්‍ය හා පරිපාලන රීති,මුදල් රෙගුලාසි ප්‍රකාරව අධිභාර මුදල වන රු.376,930.42ක මුදල මාලිම්බඩ ප්‍රාදේශීය සභාව මඟින් ගෙවීම සුදුසු නොවන බවටත් ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

## තීරණ අංක 6:12

සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල මඟින් එවා ඇති ENMT 01 IN 202258169 අංක හා 2023.01.04 දිනැති ලිපිය අනුව එහි සඳහන් හිඟ වාරික මුදල වන රු.685,052.53ගෙවීමටත් ප්‍රාදේශීය සභා පනත,මූල්‍ය හා පරිපාලන රීති,මුදල් රෙගුලාසි ප්‍රකාරව අධිභාර මුදල වන රු.376,930.42ක මුදල මාලිම්බඩ ප්‍රාදේශීය සභාව මඟින් ගෙවීම සුදුසු නොවන බවටත් තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

## යෝජනා අංක 6:13

උසාවි නියෝග මත නඩු පවතින ඉඩම් වල දේපළ සභාව මඟින් වෙන්දේසි කිරීමේදී හෝ ටෙන්ඩර් කිරීමේදී පරිපාලන හා අනෙකුත් වියදම් වෙනුවෙන් 2%ක පමණ මුදලක් අයකර අදාළ වියදම් පියවා ගැනීමට ගත් මුදල් කමිටු නිර්දේශය අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ඒ අනුව එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## තීරණ අංක 6:13

උසාවි නියෝග මත නඩු පවතින ඉඩම් වල දේපළ සභාව මඟින් වෙන්දේසි කිරීමේදී හෝ ටෙන්ඩර් කිරීමේදී පරිපාලන හා අනෙකුත් වියදම් වෙනුවෙන් 2%ක පමණ මුදලක් අයකර අදාළ වියදම් පියවා ගැනීමට ගත් මුදල් කමිටු නිර්දේශය අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**<u>යෝජනා අංක 6:14</u>**

ඇල්ගිරිය යහලමුල්ල මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු සභාවට යොජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු උපසභාපති පී.ජී. පාලිත කුමාර මහතා

**<u>තීරණ අංක 6:14</u>**

ඇල්ගිරිය යහලමුල්ල මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:15</u>**

හොරගොඩ දකුණ,හොරගොඩ බටහිර,හොරගොඩ නැගෙනහිර,ඇල්ගිරිය,පහළ කියාඩුව ග්‍රාම නිලධාරී වසම් වල සහ සෙන්ට්‍රල් පාර්ක් ගම්මානයේ ජාතික ජල සම්ප්‍රාදන මණ්ඩලය මඟින් බෙදා හරින පානීය ජලය ලබා දීම සඳහා නල පද්ධතිය එලීම වෙනුවෙන් කානු කැපීමට ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය ඉන්ධන සමඟ යෙදවීමට සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා

**<u>තීරණ අංක 6:15</u>**

හොරගොඩ දකුණ,හොරගොඩ බටහිර,හොරගොඩ නැගෙනහිර,ඇල්ගිරිය,පහළ කියාඩුව ග්‍රාම නිලධාරී වසම් වල සහ සෙන්ට්‍රල් පාර්ක් ගම්මානයේ ජාතික ජල සම්ප්‍රාදන මණ්ඩලය මඟින් බෙදා හරින පානීය ජලය ලබා දීම සඳහා නල පද්ධතිය එලීම වෙනුවෙන් කානු කැපීමට ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී යන්ත්‍රය ඉන්ධන සමඟ යෙදවීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:16</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය ලේකමෙග් MLB/SMD/RESOP/57/03 අංක දරණ ලිපිය මඟින් ඉල්ලීම් කර ඇති මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ භාවිතා කරන ලද මඩු වලින් ඉවත් කර තෙලිජ්ජවිල පැරණි කාර්යාලයේ ඇති සෙවිලි තහඩු 29ක් සමෘද්ධි සංවර්ධන අංශය මඟින් ඉදි කරනු ලබන සෞභාගයා නිවාස වැඩසටහන යටතේ ඉදිකරනු ලබන නිවසෙහි වහලය සවි කිරීම සඳහා ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී පිටිදුව ගමගේ විමලවංශ මහතා

**<u>තීරණ අංක 6:16</u>**

මාලිම්බඩ ප්‍රාදේශීය ලේකමෙග් MLB/SMD/RESOP/57/03 අංක දරණ ලිපිය මඟින් ඉල්ලීම් කර ඇති මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ භාවිතා කරන ලද මඩු වලින් ඉවත් කර තෙලිජ්ජවිල පැරණි කාර්යාලයේ ඇති සෙවිලි තහඩු 29ක් සමෘද්ධි සංවර්ධන අංශය මඟින් ඉදි කරනු ලබන සෞභාගයා නිවාස වැඩසටහන යටතේ ඉදිකරනු ලබන නිවසෙහි වහලය සවි කිරීම සඳහා ලබා දීමට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

**<u>යෝජනා අංක 6:17</u>**

සෙන්ට්‍රල් පාර්ක් ගම්මානය ආරම්භ වන ස්ථානය(කද්දුව පාර) ඉතා අහලන් තත්ත්වයට පත්ව ඇති බැවින් එම ස්ථානය කොන්ක්‍රීට් කිරීම සඳහා ප්‍රජා මණ්ඩල අරමුදලින් රු.75000.00ක මුදලක් ලබා ගැනීම සඳහා 2022.12.31 සෙන්ට්‍රල් පාර්ක් ප්‍රජා මණ්ඩල මාසික සභා රැස්වීමෙදී ඒකමතිකව සහා සම්මත කරන ලද නිරෝෂා මහත්මිය විසින් ඉදිරිපත් කල යෝජනාව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාවට යෝජනා කරමි.

යෝජනා කළේ :- ගරු සභාපති සෝමසිරි වීරමන් මයා
ස්ථිර කළේ :- ගරු මන්ත්‍රී ලසන්ත රණසිංහ මහතා

**තීරණ අංක 6:17**

සෙන්ට්‍රල් පාර්ක් ගම්මානය ආරම්භ වන ස්ථානය(කද්දුව පාර) ඉතා අහලන් තත්ත්වයට පත්ව ඇති බැවින් එම ස්ථානය කොන්ක්‍රීට් කිරීම සඳහා ප්‍රජා මණ්ඩල අරමුදලින් රු.75000.00ක මුදලක් ලබා ගැනීම සඳහා 2022.12.31 සෙන්ට්‍රල් පාර්ක් ප්‍රජා මණ්ඩල මාසික සභා රැස්වීමෙදී ඒකමතිකව සහා සම්මත කරන ලද නිරෝෂා මහත්මිය විසින් ඉදිරිපත් කල යෝජනාව අනුමත කිරීම සුදුසු බවට තීරණය විය.

ඒ අනුව එම තීරණය ඒකමතිකව සහා සම්මත විය.

### 7) කාරක සභා වාර්තා /කමිටු වාර්තා අනුමත කිරීම.

2022.12.22 තාක්ෂණික කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කළ අතර එය ඒකමතිකව සහා සම්මත කරන ලදී.

### 8) ආදායම් වියදම් පිළිබඳ වාර්තා සලකා බැලීම.

2022 දෙසැම්බර් මස ලැබීම් හා ගෙවීම් සාරාංශ වාර්තා සභාව වෙත ඉදිරිපත් කිරීම.

### 9) වෙනත් කරුණු

ගරු සභාපති පී.ජී. පාලිත කුමාර මහතා

ගරු සභාපතිතුමනි,විමලවංශ මන්ත්‍රීතුමා ගිය සභාවේ යෝජනාවක් කරා වල්පිට පාලම හා බෝක්කුව පිළිබඳව.ඊයෙ දවසෙ අපි ආණ්ඩුකාරතුමාගේ අවධානයත් ඒ පිළිබඳ යොමු කෙරෙව්වා. මමයි එදා සභාපති විදියට වැඩබැලුවෙ මේ වෙනකොට පස්ටික එතන දාලා පාර දෙපැත්ත වහල තියනවා.රචිත මන්ත්‍රීතුමා යෝජනාවක් කරා ගම් මට්ටමින් මත්ද්‍රව්‍ය උවදුර පිළිබඳ දෙමව්පියන් දැනුවත් කිරීටම් වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න.ඒ අනුව මේ මොහොත වන විට කොළඹ මත්ද්‍රව්‍ය හා මත්පැන් ආයතනය හා සම්බන්ධ වුනා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට කතා තලා ඒ වගේම පොලිසියට,කොට්ඨාශ නිලධාරින්ට කතා කලා ඒ ඒ කොට්ඨාශ වල ඒ කටයුත්ත ක්‍රියාත්මක වෙමින් යනවා ඇති සංවර්ධන නිලධාරින් හරහා බොහොම ඉක්මනින් ඒක කරන්න පුළුවන් වේවි.පන්සල් වලට කතා කලා මාලිම්බඩ කොට්ඨාශෙ සාමනේර හාමුදුරුවන් වහන්සේලා වැඩම කරලා 5 වෙනිදා මත්ද්‍රව්‍ය වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා.හාමුදුරුවන් හරහා ලොකු දැනුවත් කිරිමක් අපිට කරන්න පුළුවන්.පරාටි වලේ කිඹුලා ගැන කතා කලා කිඹුලා දැන් නැහැ කියනවා වතුර එක්ක ගිහිල්ලා.අවශ්‍ය තැන් වලට ඒ පිළිබඳ කතා බහකරලා දෙපැත්තෙම බෝඩ් ගහලා තියනවා කිඹුලන්ගෙන් ප්‍රවේශම් වන්න කියලා.සභාපතිතුමනි මං ඉල්ලීමක් කරන්න නැගිට්ටේ ඇත්තටම ඡන්දයක් ආවත් නැතත් ඉල්ලුවත් නැතත් මට ගමට යන්න පුළුවන්කමක් නෑ.ඒ තමයි අවුරුදු ගානක් සභාවේ ඉදලත් ගමට යන ප්‍රධාන පාර මේ වනවිට කිසිදු වාහනයක් යන්න පුළුවන් තත්ත්වයක නෑ.මීට කලිනුත් මං මේ සභාවෙන් ඉල්ලීමක් කලා අඩුම ගානේ ABC ටිකක් හරි දාලා මහ වලවල් ටික වහලා දෙන්න කියලා.සේනානි විද්‍යාලයට යන පාර සම්පූර්ණයෙන්ම වහලා දාලා තියෙන්නේ.5 වෙනි මාසේ 11 වෙනිදා මගේ යෝජනාව මේ සභාවේ සම්මත වෙලා තියනවා අද දවසෙත් මං ඉල්ලීමක් කරනවා සභාවේ උපසභාපති විදියට පාරෙ පැත්තක් වහලා දාලා තියනකොට හරි කණගාටුවක් එන්නෙ.කිලෝමීටර් ලක්ෂයේ

වැඩසටහනට මේ පාරවල් භාරදුන්නා ඒකෙන් කෙරෙන්නෙත් නැති නිසාත් RDA එකෙන් මාස දෙකක් වෙනවා උත්තරයක් නැති නිසාත් අර වලවල් ටික වහල දෙන්න එහෙම නැත්තම් RDA එකෙන් නිදහස් කරලා සභාවේ මුදලක් තියනවා නම් මට කරලා දෙන්න.කොට්ඨාශ නිලධාරිතුමිය ගියපු වෙලාවෙත් මිනිස්සු කියලා තියෙන්නෙ ප්‍රජා ශාලාවත් එපා මොකක්වත් එපා පුළුවන්නම් වලවල් ටික වහලා දෙන්න කියලා.ඒ නිසා ඒ ඉල්ලීම කරමින් නිහඬවනවා ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී චමින්ද සාගර එදිරිසූරිය මද්දුමගේ මහතා</u>

සියලු දෙනාට සුභ නව වසරක් වේවා.ඇත්තටම මං කතා කරන්නේ දිගින් දිගටම කතා කරපු කාරණාවක් ගැන කතා කරන්න.පලවෙනිදා මගේ කොට්ඨාශෙට වීදි පහන් හදන්න තිබුනෙ.එදා ඉතිං මං කතා කරේ නෑ.නමුත් ඊයෙ මං ඒ කාර්මික මහත්මයාගෙන් ඇහුවම කිව්වෙ අපි ඉල්ලුවට බඩු දෙන්නෑ කිව්වා ගබඩාවෙන්.මිනිස්සු පොතේ ලියලා දවස් ගානක් වෙනවා එවා හදන්න එන්නෙ නෑ.ඒ වගේම ලං.වි.ම හා ටෙලිකොම් එක කොන්ත්‍රාත්කරුවන් දාලා අතු කපන ඒවා කරනවා නමුත් ඒ බොහොමයක් ඒවා අපේ කම්කරුවො විසින් තමයි කරන්නෙ.මං කියන්නෙ අපේ කම්කරුවොන්ගෙ ආරක්ෂාව ගැන වැඩ පිළිවෙලක් හදලා ඒ ආයතන දෙකත් එක්ක කතා කරලා අපේ කම්කරුවො ලව්වාම ඒක කරන්න කතා කරගත්තානම් සභාවට අමතර ආදායමක් ගන්න පුළුවන් කියලා.ඒ ගැනත් හොයලා බලලා කටයුතු කරමු කියලා ඉල්ලීමක් කරනවා.ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී ජී.පී. උදයසාන්ත මහතා</u>

ගරු සභාපතිතුමනි,මන්ත්‍රී ප්‍රතිපාදන වලට අදාල ලියුම බොහොම අමාරුවෙන් සභාවේ තිබිලා හොයාගත්තා.TO මිස් කියන්නෙ සෘජු ශ්‍රමය යටතේ කරන්න කියලා.සභාපතිතුමා එහෙම එකක් නෑ.මේ මුදලෙන්ම කර්මාන්ත 03ක් කරලා තියනවා අපි.ඒ අවස්ථාවේ කරෙත් සමිතියක් අත්සන් කරලා.ඊට කලිනුත් වැඩ 03ක් කලා.ඒ ගැටලුවට අමතරව කියන්න ඕන.එකමුතු මාවත ස්කේන්ටර් යන්ත්‍ර යොදලා කරපු මුදල ඔබතුමා හිටපු නැති සභාවේ ඊට පස්සෙදිම කතා කරලා කරන්න කටයුතු කලා ගිය සභාවෙන් උප සභාපතිතුමා මූලාසනය දැරුවේ.මං අද උදෙත් කතා කලා අදටත් ලැබිලත් නෑ.ඒ ගැනත් කණගාටුව ප්‍රකාශ කරනවා.මිස් කෙනෙක් කතා කරලා කිව්වා හොරගොඩ ආඳදොළ ප්‍රජා ශාලාවේ තියන ඉඩමෙත් හොරගොඩ මුස්ලිම් පෙර පාසල තියන ඉඩමෙත් අයිතිය පිලිබඳ කිසිම ලේඛණයක් සභාවේ නෑ කියලා.මම ඒ ගැන කරුණු හොයලා බැලුවා.හිටපු සභාපති කල්‍යාණ අබේසිංහ මැතිතුමා ඉද්දි තමයි හොරගොඩ මුස්ලිම් පෙර පාසල තියන ඉඩම සභාවට අරන් තියෙන්නේ 1993දී ඔප්පුවකින්.ශ්‍රී වර්ධනාරාම ප්‍රජා ශාලාවේ ඔප්පුවේ පිටපතකුත් නැතිවෙලා.ඵලදායාතාවයට සහතික ගත්තට වැඩ නොකෙරෙන්න හේතුවක් තමයි මේ ලියුම් නැතිවෙන එක.ආඳදොළ ප්‍රජා ශාලාවත් සභාව සතු ගොඩනැගිල්ලක්.ඒකත් සභාවෙ නැතිලු.මෙන්න මේ ගැටලු නිරාකරණය කරන්න අපි සභාවේ හිටියත් නැතත් සභාවේ දේපල නැති වෙනවා කියන්නෙ ජාතික අපරාධයක්.ඒ නිසා මේවා ආරක්ෂා කරගන්න වැඩපිළිවෙලක් හදන්න කියලා ඉල්ලනවා.ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී පන්නිගල ගමගේ තරංගා මිය</u>

සියලු දෙනාට සුභ නව වසරක් වේවා.සභාපතිතුමා මාලිම්බඩ ජයවර්ධන මාවතේ 3වන පටුමග පන්නිගල.පාර දෙපැත්තෙ ගස්වල අතු පාරට ඇවිල්ලා අනාරක්ෂිත අතු කපන්න කියලා මිනිස්සු සල්ලිත් බැදා මමත් මේ සභාව දැනුවත් කලා.මාසයක් වනතුරුත් තාම ඒක වෙලා නෑ.ඒ දේ කරලා දෙන්න කියලා ඉල්ලනවා ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී දික්මාදුගොඩගේ බන්දුල මහතා</u>

මම ප්‍රථමයෙන් කියන්න කැමතියි පසුගිය දිනක මගේ බිරිඳගෙ මෑණියන්ගේ අවමංගල්‍යය පැවැත්වුණා.එයට සහභාග වූ සියලු දෙනාට මං හෘදයාංගම ස්තූතිය ප්‍රකාශ කරනවා.සභාපතිතුමා මං පාරක ශ්‍රමදානයක් කරන්න මාස 6ක ඉඳන් ඉල්ලනවා සභාවේ අනුමැතියත් ලැබිලා තියනවා.ශක්‍යතා වාර්තා ඉදිරිපත් වෙලා තියනවා ඒත් ශ්‍රමදානය

කරගන්න බැරි වෙලා තියනවා හැබැයි බැකෝ එක ඉල්ලුවම දෙන්න බෑ කිව්වා මට ආරංචියි අකුරුගොඩ පැත්තෙ මොන වාර්තාවක්වත් නැතුව කානුවක් කපලා සුද්ද කලා කියලා.ඇත්තද බොරුද කියලා මං දන්නෑ.වසන්ත මන්ත්‍රීතුමාගේ හා උපසභාපතිතුමාගේ උපදෙස් නැතුව ගිහින් වැඩ කලා කියලා ආරංචියි.අපි මේ මාස ගාණක් තිස්සේ බැකෝ එක ඉල්ලනවා පාරක් සුද්ද කරගන්න.ඒකට වාර්තාවක් ඕනලු.ගෙදරට යන පාර හදන්න නෙවෙයි පොදු පාරක් හදන්න ඉල්ලන්නෙ.තාම තාක්ෂණ නිලධාරි වාර්තාවක් නැතිලු ශ්‍රමදානයක් පවත්වන්න.ඒකට කණගාටුව ප්‍රකාශ කරමින් ඉක්මනින් දිනයක් දෙන්න කියලා ඉල්ලමින් නවතිනවා ස්තූතියි.

<u>ගරු මන්ත්‍රී සමන් දෙනිපිටියගේ මහතා</u>

ලැබූ නව වසර අතමිට සරු නිරෝගී වසරක් වේවා යැයි ප්‍රාර්ථනා කරනවා.වසරක් ගෙවිලා නව වසරක උදාවත් සමග සභා කාලයත් අහෝසි වෙලා යන තත්ත්වයක් තමයි අපිට පේන්න තියෙන්නේ.ඒ වගේම වසර 5කට ආසන්න කාලයක් තිස්සෙ සභාපතිතුමාගේ නායකත්වය යටතේ හොඳ වැඩ වලට හොඳයි කිව්වා නරක දේ ප්‍රතික්ෂේප කලා.මොකද අපිව පත් කරලා එවපු මිනිස්සු වෙනුවෙන් අපි පෙනී සිටියා.අපිට කරන්න පුළුවන් හැමදේම අපි කරා.රටේ පවතින අර්බුධ එක්ක අපහසුතා විඳදරා ගනිමින් ඉතා කටුක ජීවිතයක් මිනිසුන් ගත කරමින් ඉන්නවා.අපේ මන්ත්‍රීවරු දේශපාලන පක්ෂ කිහිපයක් නියෝජනය කරලා ආවත් සභාව තුළ සමගියෙන් කටයුතු කලා.අපි කවුරුත් ලොකු සල්ලි තියන අය නෙවෙයි තමන්ගේ කාලය ශ්‍රමය වැය කරලා ජනතා සේවයට තමයි ඇවිල්ලා තියෙන්නේ.අපිට පුළුවන් විදියට සේවයක් කරන්න අපි උත්සහ කරා.අද වනවිට ජනතාව තුළ මන්ත්‍රීවරුන්ට කිසිම සාදයක්

<u>ගරු මන්ත්‍රී පෙරමුණගේ අජිත් නාලක මහතා</u>
මම මේ සභාවේ අවුරුදු 5ක් පුරාවට නවක මන්ත්‍රීවරයෙක් විදියට වැඩ කරාගන යද්දී හැමෝම සුහදව කටයුතු කරගෙන ගියා.උදව් කලා.ඒ ගැන මං ස්තූතිවන්ත වෙනවා.මේ සභාවෙ ඉන්න කම්කරුවන්ට පවා ස්තූතිවන්ත වෙනවා ඒ අය යම් ප්‍රමාණයකින් හෝ මන්ත්‍රීවරුන්ගෙ ගරුත්වය රැකලා දෙන්න උත්සහ කලා.ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් ස්තූතිවන්ත වනවා.

<u>ගරු සභාපති සෝමසිරි වීරමන් මයා</u>
ගරු උපසභාපතිතුමනි,සියලු දෙනාම දන්නවා යුග කිහිපයකින් මේ සංවර්ධන වැඩපිළිවෙල ඇනහිටියා.පළමු යුගය තමයි අපි අවුරුදු 2ක් හිටියෙ විපක්ෂයේ. ආණ්ඩු පක්ෂයක තමයි ප්‍රාදේශීය සභාවක් තියෙන්න ඕන.විපක්ෂෙ ඉන්නකොට වැඩ කරන්න මුදල් නැතිවෙනවා.ඒ කාලය තුළ මුදල් ආවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා එහිදී සංවර්ධන කටයුතු කරන්න අපහසු වුණා.ඊට පස්සේ කොරෝනා වසංගතය ආවා.ඊටත් පස්සෙ ආර්ථික අර්බුධය එක්ක චක්‍රලේඛ ආවා සංවර්ධන කටයුතු නවත්තන්න කියලා.60%ක් දක්වා වැඩ කරන්න කියලා ආවම කාරණා 2ක් බලපෑවා.වැඩ කරන්න බෑ නිලධාරින් බිය වද්දලා.උනින්දුවෙල පන්සලට පස් කන්දත් කඩන් වැටුනා වෙලාවේ JCB එක දාලා ඒක අයින් කලා නිවාඩු දවස් නිසා තාක්ෂණ නිලධාරීන් එන්න බෑ කිව්වා.අපේ JCB ක්‍රියාකරුට ප්‍රශ්නෙ ආපු නිසා මං ඒකට අත්සන් කලා.ආපදාවක් වුණාම නිවාඩු ද රෑද කියලා අදාල නෑ ඒවට විසඳුම් දෙන එක සභාවේ වගකීම.එහෙම තියෙද්දි අපිට සිද්ද වුනා සමහර තීරණ ගන්න.අන්තිමට මට තමයි චෝදනාව ආවේ.වෙනිඅකුල කිරිමැටිමුල්ල පාර තාම පටන් ගත්තෙ නෑඑ.ඒක කම්කරුවො දාලා කරන්න ඕන JCB එක දාලා කරන්න බෑ.අපි පස්සට ගියා අර්බුධ හැදුවා.ඔබතුමාලත් වැරදි පැත්තට ගියා.ඒවටත් හේතු තිබුණා.ඊලගට C.E.B එක කොන්ත්‍රාත් කරුවන්ට නෙවෙයි ගස් කැපීම් කටයුතු වලදි මුදල් ගෙවන්නෙ සභාවට ටෙලිකොම් එකෙන් විතරයි කතා කරගන්න තියෙන්නේ.

සභාපතිතුමාගේ ස්තුති කථාවෙන් පසු ප.ව. 3.00 ට පමණ සභාවේ වැඩ කටයුතු නිමා කරන ලදී.

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව